රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 10/94

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1994 පෙබරවාරි මස 08 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා ප්‍රතිව්‍යුහගත කිරීම.

අංක: 44/90 හා 1990.10.18 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සමගම රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සේවක සංඛ්‍යා යලි සැකසීමට රජය අදහස් කර ඇත.

ඉහත චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරීන් විශ්‍රාම යෑම හේතුවෙන් ඇතිවූ පුරප්පාඩු සියල්ලම පිරවුවහොත් 44/90 චක්‍රලේඛය නිකුත් කිරීමෙන් රජය අපේක්ෂා කල අරමුණු සපුරාගත හැකි නොවනු ඇත. එසේ වුවහොත් මෙම පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන අයගේ වැටුප් ගෙවීම සඳහා බිලියන දෙකකට ආසන්න අතිරේක වැය බරක් දැරීමට ද රජයට සිදුවනු ඇත. මෙම තත්ත්වය අනුව පහත සඳහන් අයුරු කටයුතු කල යුතු යයි තීරණය කර ඇත.

(අ) පසුගිය වසර කීපය තුළ සිදුවී ඇති සියළුම පරිපාලන වෙනස්කම් සැලකිල්ලට ගෙන අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා පළාත් සභාවල සේවක සංඛ්‍යා සමාලෝචනය කිරීම කඩිනම් කිරීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කමිටුව හා සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කළමණාකරණ ඒකකයට උපදෙස් දී ඇති හෙයින් සේවක සංඛ්‍යාව එමගින් සමාලෝචනය කරවා ගැනීම

සහ

(ආ) පුරවනු ලබන අදළ තනතුරු සඳහා අයවැය ඇස්තමේන්තුවල අරමුදල් සපයා ඇති බවට වගබලා ගැනීම සඳහා සේවක සංඛ්‍යාවේ කිසියම් පුරප්පාඩුවක් පිරවීමට පෙර ලේකම්වරුන් හා පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයවැය අධ්‍යක්ෂ ජනරාල් විමසීම.

සේවක සංඛ්‍යාවේ කිසියම් පුරප්පාඩුවක් පිරවීමට පෙර අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟත්වය ලබා ගන්නා ලෙස ඔබට දන්වනු ලැබේ. අවශ්‍ය එකඟත්වය ලබා නොගැනීමෙන් දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් ලේකම්වරුන් පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් පෞද්ගලිකවම වගකීමෙන් බැඳී සිටිනු ඇත.

මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත නිකුත් කරනු ලැබේ.

අ.කලේ/(වයි.බී.පුස්සෙදෙනිය)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.